තංගල්ල ප්‍රාදේශීය සභාව - 2024

----

1. මූල්‍ය ප්‍රකාශන

1.1. අහිතකර මතය

තංගල්ල ප්‍රාදේශීය සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාල තොරතුරුද ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10(1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මාගේ වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2024 දෙසැම්බර් 31 දිනට තංගල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

1.2. අහිතකර මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අහිතකර මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තව දුරටත් විස්තර කර ඇත. මාගේ අහිතකර මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ මුද්දර ගාස්තු ආදායම රු.මිලියන 108.89 ක් හා ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම් රු.මිලියන 39.88 ක් අඩුවෙන් ගිණුම්ගතකර තිබුණි.	2025 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කළ බව.	නිවැරදි මුද්දර ගාස්තු ආදායම දැක්වීමට කටයුතු කළ යුතුය.
(ආ)	අත්පත්කරගත් හා ඉදිකර තිබූ ඉඩම්, ගොඩනැගිලි හා මිලදීගෙන තිබූ යන්ත්‍ර උපකරණ රු.මිලියන 8.9 ක් ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.	2025 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කළ බව.	ඉඩම් හා ගොඩනැගිලි හා යන්ත්‍රෝපකරණ නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.
(ඇ)	ඉකුත් වර්ෂයේදී සිදුකරන ලද කර්මාන්ත 09 ක් වෙනුවෙන් මිල අනුපාත වෙනස් වීම් මත නැවත ලැබී තිබූ එකතු වටිනාකම රු.138,424 ක් සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වියදම් ගිණුමට බැර කිරීම නිසා ප්‍රාග්ධන වියදම් හා සමුච්චිත අරමුදල එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.	මෙවැනි ගිණුම් අඩුපාඩු සිදු නොවීමට කටයුතු කරන බව.	ගිණුම් කාල පරිච්ඡේදයට අදාල ආදායම්, වියදම් නිවැරදිව නිරූපණය කිරීමට හැකිවන පරිදි ගිණුම් තැබිය යුතුය.
(ඈ)	ආදායම් ලෙස හඳුනාගන්නා ලද එකතු වටිනාකම රු.මිලියන 3.37 ක් සමුච්චිත අරමුදලට බැර කිරීම නිසා අතිරික්තය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.	මෙවැනි අඩුපාඩු සිදු නොවන ආකාරයට කටයුතු කරන බව.	ගිණුම් කාල පරිච්ඡේදයට අදාල ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය.

(ඉ)	එකතු වටිනාකම රු. 275,980 ක් වූ ගෙවිය යුතු වියදම් ගිණුම්ගත කර නොතිබුණි.	2025 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කළ බව.	ණයහිමි ප්‍රතිපාදන වෙන්කර නොතිබුණු රු.275,980 ක් වූ වියදම් ගිණුම්ගත කළ යුතුය.
(ඊ)	වැටුප් සැකසීමේදී අඩුකරන ලද රු.245,236 ක් රජයේ දායකත්වය පුනරාවර්ථන ආධාර යටතේ හා වැටුප් වියදම් යටතේ ගිණුම්ගත කිරීම නිසා එම ගිණුම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.	මෙවැනි ගිණුම් අඩුපාඩු සිදු නොවීමට කටයුතු කරන බව.	ගිණුම්කාල පරිච්ඡේදයට අදාල ආදායම්, වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය.
(උ)	විශ්‍රාම වැටුප් දායක අරමුදලට ගෙවිය යුතු රු. 281,766 ක් රජයේ දායකත්වය පුනරාවර්තන ආධාර ලෙස ගිණුම්ගත කර නොතිබුණි.	2025 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කළ බව.	ණයහිමි ප්‍රතිපාදන රු.281,766 ක් ඇති කළ යුතුය.
(ඌ)	බිල්කල යුතු සභා බල ප්‍රදේශය තුළ පිහිටි ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි හෝටල්, ආපනශාලා සහ නවාතැන්වල ආදායමෙන් ලැබිය යුතු රු.417,009 ක් අඩුවෙන් ගිණුම්ගතකර තිබුණි.	2025 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කළ බව.	අඩුවෙන් ගිණුම්ගත කරන ලද රු.417,009 ක ලැබිය යුතු ආදායම් 2025 වර්ෂයේ ගිණුම්ගත කළ යුතුය.

1.6.2 අවිනිශ්චිත ගිණුම්

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
පෙර වර්ෂවල සිට පැවත එන අවිනිශ්චිත ගිණුමේ හඳුනා නොගත් බැර ශේෂය රු.6,248 ක් නිවැරදි කිරීමට සමාලෝචිත වර්ෂයේ දීත් කටයුතු කර නොතිබුණි.	අවිනිශ්චිත ගිණුමේ පවතින හඳුනා නොගත් බැර ශේෂයට අදාල සාක්ෂි හඳුනා ගැනිමට අවශ්‍ය කටයුතු සිදු කරන බව.	අවිනිශ්චිත ගිණුමේ ශේෂය හඳුනා ගෙන කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.

1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
වටිනාකම රු.මිලියන 37.5 ක් වටිනා ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් අදාළ උපලේඛන හා ස්ථාවර වත්කම් ලේඛන ඉදිරිපත් නොකිරීම හේතුවෙන් සතුටුදායක පරිදි සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය.	ස්ථාවර වත්කම් ලේඛන නඩත්තු නොකළ බව හා එම ලේඛන නඩත්තු කිරීමට කටයුතු කරන බව.	මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන ස්ථාවර වත්කම් ලේඛනය, උපලේඛන යනාදී සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

1.7 අනුකූල නොවීම්

1.7.1 නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත 134 (1) වගන්තිය	2018 වර්ෂයේදී හදුනාගත් දියුණු කළ ප්‍රදේශ වලින් වරිපනම් බදු අය කිරීමට කටයුතු කර නොතිබුණි.	වරිපනම් සමීක්ෂණ ලිපිගොනු තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇති බව.	දියුණුකළ ප්‍රදේශ ලෙස හඳුනාගත් ප්‍රදේශවලින් වරිපනම් අය කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි			
	i. මුදල් රෙගුලාසි 371 (2)	මාණ්ඩලික නොවන නිලධාරීන් 05 දෙනෙකුට අවස්ථා 06 කදී එකතුව රු.110,065 ක් වූ අතුරු අග්‍රිම ලබාදී තිබුණි.	මාණ්ඩලික නිලධාරි මඟින් අත්තිකාරම් ලබා දීම සිදු කරන බව.	අතුරු අග්‍රිම ලබා දීම මුදල් රෙගුලාසි අනුව මාණ්ඩලික නිලධාරීන්ට වන පරිදි සිදු කළ යුතුය.
	ii. මුදල් රෙගුලාසි 396 (ඇ)	නිකුත් කල නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ කල් ඉකුත් වූ එකතු වටිනාකම රු.190,163 ක් වූ චෙක්පත් 21 ක් සම්බන්ධයෙන් යොමුගත රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කරන බව.	මුදල් රෙගුලාසි ප්‍රකාරව නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ කල් ඉකුත් වූ චෙක්පත් සම්බන්ධයෙන් කටයුතු කළ යුතුය.
(ඇ)	2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 02(iv) වන වගන්තිය	ඇඟිලි සලකුණු යන්ත්‍රය මඟින් කාලය සනාථ කර ගැනීමෙන් තොරව නිලධාරීන් හා සේවකයින් 31 දෙනෙකුට එකතුව රු.264,463 ක් වූ අතිකාල දීමනා ගෙවා තිබුණි.	ඇඟිලි සලකුණු යන්ත්‍රය මඟින් කාලය සනාථ කර අතිකාල දීමනා ගෙවීමට මේ වන විට කටයුතු කර ඇති බව.	චක්‍රලේඛය ප්‍රකාරව ඇඟිලි සළකුණු යන්ත්‍රය මඟින් කාලය සනාථ කර ගෙන ගෙවීම් කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.මිලියන 19.43 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.මිලියන 144.18 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සභාවේ ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

	2024				2023			
ආදායම් ප්‍රභවය	ඇස්තමේන්තුගත ආදායම	බිල් කළ ආදායම	රැස් කළ ආදායම	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය	ඇස්තමේන්තුගත ආදායම	බිල් කළ ආදායම	රැස් කළ ආදායම	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය
	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
වරිපනම් හා බදු	1,698,000	2,500,588	2,622,751	1,267,164	1,478,000	8,343,339	7,783,087	1,389,327
කුලී	12,097,530	13,362,407	14,039,784	1,443,810	19,710,700	11,593,000	11,212,555	2,121,187
බලපත්‍ර ගාස්තු	4,147,100	11,247,285	9,295,584	3,713,244	1,776,100	8,685,034	7,454,016	1,761,543
වෙනත් ආදායම්	17,938,039	36,783,195	39,428,864	688,864	23,583,000	26,108,412	23,139,379	3,334,533
එකතුව	**35,880,669**	**63,893,475**	**65,386,983**	**7,113,082**	**46,547,800**	**54,729,785**	**49,589,037**	**8,606,590**

2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ව්‍යාපාර ඒකක 517 කින් ලැබිය යුතු ව්‍යාපාර බදු හා කර්මාන්ත බදු රු.මිලියන 1.02 ක් ප්‍රාදේශීය සභා පනතේ 150(1) වගන්තිය ප්‍රකාරව අයකර ගෙන නොතිබුණි.	ව්‍යාපාර බදු හා කර්මාන්ත බදු රු.60,000 ක් අයකර ගත් බවත් හිඟ මුදල් කඩිනමින් අය කර ගැනීමට කටයුතු කරන බව.	පනතේ 150 (1) වගන්තිය ප්‍රකාරව ලැබිය යුතු ව්‍යාපාර බදු හා කර්මාන්ත බදු අයකර ගත යුතුය.
(ආ)	ලැබිය යුතු අක්කර බදු රු.247,984 ක් අයකර ගෙන නොතිබුණි.	ඉඩම් හිමියන්ගේ ලිපිනයන් ලේඛනයේ නොමැති බව ද එම ගැටළුවට කඩිනමින් විසඳුම් ගෙන හිඟ අයකර ගැනීමට කටයුතු කරන බව.	අක්කර බදු අයකළ යුතු ඉඩම් නිවැරදිව හඳුනාගෙන බිල්කළ යුතු අතර හිඟ මුදල් කඩිනමින් අයකර ගත යුතුය.

(ඇ)	කඩ කාමර 50 කින් ලැබිය යුතු කඩ කුලී රු.830,874 ක් හා වාර්ෂිකව බදුදෙන දේපළ 04 කින් ලැබිය යුතු කුලී රු.651,499 ක් ප්‍රාදේශීය සභා පනතේ 159(1) වගන්තිය ප්‍රකාරව අයකර ගෙන නොතිබුණි.	කඩ කාමර කුලී හිඟ ශේෂයෙන් රු.232,545 ක මුදලක් අය වී ඇති බවත් වාර්ෂික බදුදෙන දේපල හිඟ මුදල අයකර ගැනීම සඳහා දේපලෙන් දේපලට ලිපි ගොනු සකසා අවශ්‍ය තොරතුරු එක්රැස් කරමින් පවතින බව.	පනතේ 159 (1) වගන්තිය ප්‍රකාරව හිඟ ආදායම් කඩිනමින් අය කර ගත යුතුය.
(ඇ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු පිළිවෙලින් රු.මිලියන 3.18 ක් හා රු.මිලියන 113.57 ක් විය.	උසාවි දඩ රු.මිලියන 1.41 ක් ද මුද්දර ගාස්තු රු.මිලියන 64.5 ක් ද අයකර ගෙන ඇති බවත් හා ඉතිරිය අයකර ගැනීමට කටයුතු කරන බව.	ප්‍රධාන ලේකම්, ආණ්ඩුකාර තුමා හා ඉඩම් රෙජිස්ටාර් කාර්යාලය සම්බන්ධීකරණය කර මේ සම්බන්ධ විධිමත් වැඩපිළිවෙලක් සකස් කළ යුතුය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 හඳුනාගත් පාඩු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 වර්ෂය සඳහා සභාව සතු දේපල බදුදීම සම්බන්ධ ටෙන්ඩර් කැඳවීමට පුවත්පත් 03 ක දැන්වීම් පළකර තිබූ අතර ඒ සඳහා රු.77,242 ක වියදමක් දරා තිබියදී නැවත එම දැන්වීම සංශෝධනයකර පල කිරීමට රු.24,633 ක අමතර වියදමක් සභා අරමුදලින් දරා තිබීමෙන් මුදල් රෙගුලාසි 127(7) ඡේදය ප්‍රකාරව නිලධාරීන්ගේ නොසැලකිල්ල මත සහා අරමුදලට සිදුවූ පාඩුව වගකිවයුතු නිලධාරීන්ගෙන් අයකරගත යුතුය.	පළමු පත්තර දැන්වීමේ ලංසු මුදල වැරදි ලෙස සටහන් වී ඇති බවත්, එය නිවැරදි කිරීම සඳහා සංශෝධිත පත්තර දැන්වීමක් පල කිරීමට සිදු වූ බව.	මුදල් රෙගුලාසි ප්‍රකාරව නොසැලකිල්ල මත සහා අරමුදලට සිදු වූ පාඩුව අයකර ගත යුතුය.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සභාව විසින් අනුමත කර තිබූ ගොඩනැගිලි සැලසුම් 05 කට අදාළව ආවරණ අනුමැතිය ලබා දීමේ ගාස්තු, පෙරසැරි ගාස්තු, අනුකූලතා සහතික ගාස්තු ලෙස එකතුව රු.මිලියන 1.72 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. ගොඩනැගිලි තුනක ඉදිකිරීම් කටයුතු නිමකර අනුකූලතා සහතික ලබා නොගෙන ව්‍යාපාර කටයුතු පවත්වාගෙන ගියද, සභාව ඒ සම්බන්ධයෙන් නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	අදාල ගාස්තු වලින් රු.70,808 ක් ගෙවීම් කර ඇති බව හා හිඟ ගාස්තු අය කිරීමට හා නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව.	අදාල ගාස්තු කඩිනමින් අයකර ගැනීමට සහ නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
ඉකුත් වර්ෂ වලදී හා සමාලෝචිත වර්ෂයේදී කර්මාන්ත 19 ක් සඳහා පරිසර බලපත්‍ර ගැනීමට කර්මාන්තකරුවන් උනන්දු කරවීමට හා පරිසර බලපත්‍ර ලබාදීමට සභාව කටයුතු නොකිරීම මත සභාවට ලැබිය යුතු රු. 94,050 ක ආදායම් අහිමි වී තිබුණි.	එක් කර්මාන්තයක් වසා ඇති බව හා අනෙකුත් කර්මාන්ත 18 සම්බන්ධයෙන් ලිඛිතව දැනුවත් කර ඇති බව.	පරිසර බලපත්‍ර ලබාගත යුතු කර්මාන්ත 18 සඳහා බලපත්‍ර ලබා දී ආදායම් කඩිනමින් රැස්කර ගත යුතුය.

3.4 වත්කම් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සභාව භුක්ති විඳින ඉඩම් කොටස් හා සුසාන භූමි 109 ක සහ වාහන 5 ක නීත්‍යානුකූල අයිතිය සභාව වෙත පවරා ගෙන නොතිබුණි.	ඉඩම් හා සුසාන භූමි පවරා ගැනීමට කටයුතු කරන අතර වාහන ලියාපදිංචි අයිතිය ලබා ගැනීමට කටයුතු සිදුකරන බව.	සභාව භුක්ති විඳින ඉඩම් කොටස්, සුසාන භූමිවල හා වාහනවල නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කඩිනමින් පියවර ගත යුතුය.

3.5 ව්‍යාපෘති, කර්තව්‍යන් හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේ වාර්ෂික අයවැය ලේඛනය මගින් රු. 200,000 ක ප්‍රතිපාදන වෙන්කළ සංවර්ධන යෝජනාවක් ක්‍රියාත්මක කර නොතිබුණි.	අලුතින් සී.සී.ටී.වී කැමරා පද්ධතියක් සවි කිරිමක් සඳහා තාක්ෂණික ඇගයීම් වාර්තාවක් ලබා ගෙන සිදු කරන බව.	අයවැය මගින් ප්‍රතිපාදන වෙන් කර තිබූ සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කළ යුතුය. නැතහොත් සැලසුම් සුදුසු පරිදි සංශෝධනය කළ යුතුය.

3.6 ප්‍රසම්පාදන කළමනාකරණය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සභාව සතු බවුසර් රථය අලුත්වැඩියාව සම්බන්ධයෙන් 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.4, 5.6.1(අ) හා 6.2.2 ප්‍රකාරව කටයුතු කර නොතිබුණු අතර මෙම අළුත්වැඩියාව සඳහා රු.මිලියන 2.81 ක් ගෙවීම් කර තිබුණ ද අදාල ආයතනය සමඟ සේවා ගිවිසුමකට එළඹ නොතිබුණි.	ඉදිරි ප්‍රසම්පාදන කටයුතු වලදී මාර්ගෝපදේශය අනුව කටයුතු කරන බවත් සේවා ගිවිසුම් වලට එළඹෙන බව.	මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුකූලව කටයුතු කළ යුතුය.

3.7 මානව සම්පත් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සභාවේ අනුමත හා තථ්‍ය කාර්යය මණ්ඩලය පිළිවෙලින් 87 ක් හා 127 ක් වූයෙන් අතිරික්තතා 40 ක් විධිමත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	අතිරික්ත සේවක සංඛ්‍යාව අනුමත කර දෙන ලෙස ඉල්ලීම් කර ඇති බව.	සභාවේ කාර්ය මණ්ඩල අවශ්‍යතාවය පිළිබඳ විධිමත් සමාලෝචනයක් සිදු කළ යුතුය.

4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

4.1 විගණන හා කළමනාකරණ කමිටුව

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් අවම වශයෙන් කාර්තුවකට වරක් එනම් වර්ෂයකට 4 ක් වන පරිදි පැවැත්විය යුතු වුවද 2024 වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු 2 ක් පමණක් පවත්වා තිබුණි.	2025 වර්ෂයේ විගණන කමිටු රැස්වීම් කාර්තුවකට එකක් ලෙස කමිටු 04ක් පැවැත්වීමට කටයුතු කරන බව.	කාර්තුවකට වරක් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම පැවැත්විය යුතුය.

4.2 අයවැය පාලනය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
වැය විෂයයන් අතර රු.මිලියන 22.15 ක් ප්‍රතිපාදන මාරුකිරීම් සිදු කර තිබූ අතර වැය විෂයයන්ට අදාළව නිවැරදිව අයවැය ප්‍රතිපාදන වෙන්කර නොගැනීම මෙම තත්ත්වයට හේතු වී තිබුණි.	නව සේවකයන් බඳවා ගැනීම හා හදිසි ආපදා තත්වයන් හේතුවෙන් මාර්ග නඩත්තු කටයුතු වෙනුවෙන් වෙන් කිරීම් ප්‍රමාණවත් නොවූ බව.	වියදම් නිවැරදිව හඳුනාගෙන අවශ්‍ය ප්‍රතිපාදන නිවැරදිව ඇස්තමේන්තු කළ යුතුය.

4.3 පාරිසරික ගැටලු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මධ්‍යම පරිසර අධිකාරිය විසින් ලබාදී තිබූ පරිසර ආරක්ෂණ බලපත්‍රයේ කොන්දේසි අංක 2.2 හා 2.3 ට අනුගත නොවන පරිදි කොම්පෝස්ට් නිෂ්පාදනය සඳහා ගෙන එන නාගරික ඝණ අපද්‍රව්‍ය හෝ වෙනත් ඝණ අපද්‍රව්‍ය සභාවේ කොම්පෝස්ට් අංගන භූමියේ විවෘතව ගොඩගසා තිබූ අතර කොම්පෝස්ට් නිෂ්පාදනයට ගෙන එන ලද අපද්‍රව්‍ය විවෘත භූමියේ පිළිස්සීම සිදුකර තිබුණි.	පරිසර ආරක්ෂණ බලපත්‍රයේ කොන්දේසි 2.3 අනුව මේ වන විට විවෘත භූමියේ අපද්‍රව්‍ය පිළිස්සීම සිදු නොකරන බව.	පරිසර ආරක්ෂණ බලපත්‍රයේ කොන්දේසි වලට අනුගතව විය යුතු අතර ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙළක් සකස් කළ යුතුය.

(ආ)	පරිසර ආරක්ෂණ බලපත්‍රයේ කොන්දේසි අංක 3.1 ට අනුගත නොවන පරිදි කොම්පෝස්ට් බවට පත්කළ නොහැකි සණ අපද්‍රව්‍ය විවෘත භූමියක බැහැරකර තිබූ අතර ප්‍රතිචක්‍රීකරණය කළ හැකි ද්‍රව්‍ය වෙන් කර ප්‍රතිචක්‍රීකරණය කළ නොහැකි ද්‍රව්‍ය පමණක් සනීපාරක්ෂක කසළ රඳවනයක් වෙත යොමු කිරීමට පියවර ගෙන නොතිබුණි.	සන අපද්‍රව්‍ය මොන්රෝවියා වත්ත සන අපද්‍රව්‍ය මධ්‍යස්ථානයට යවන බව.	පරිසර ආරක්ෂණ බලපත්‍රයේ කොන්දේසි වලට අනුගතව විය යුතු අතර සන අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙළක් සකස් කළ යුතුය.